1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/10/01/25/114 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2024.05. 10 |

**උපදෙස් ලිපි 01/2024**

දකුණු පළාත් සභාවේ
සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,
ගණන්දීමේ නිලධාරීන්

**<u>නොදන්වා සේවයට වාර්තා නොකිරීම මත සේවය හැරගිය නිලධාරීන්ට වැරදි ලෙස වැටුප් ගෙවීම</u>**

නොදන්වා සේවයට වාර්තා නොකිරීම මත සේවය හැරගිය නිලධාරීන්ට සේවයේ සිටියා සේ සලකා වැටුප් ගෙවා ඇති අවස්ථා අභ්‍යන්තර විගණන පරීක්ෂණ වලදී බහුල ලෙස නිරීක්ෂණය වී ඇති බව අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් මා වෙත වාර්තා කර ඇත.

02.ඉදිරියේදී මෙම තත්ත්වය ඇතිවීම වළක්වා ගැනීමටත් එසේ ගෙවා ඇති වැටුප් වේනම්, ඒවා වගකිවයුතු අයගෙන් අයකර ගැනීමටත් වහාම පියවර ගත යුතුවේ.

03.තවදුරටත් මේ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන අවශ්‍ය නිවැරදි කිරීම් හා ඉදිරි කටයුතු සිදුකරන මෙන් දන්වමි.

I.සේවකයන් පැමිණීම වාර්තා කළයුතු ඒකකය පැහැදිලිව හඳුනාගෙන, එම ඒකකවල ප්‍රධානීන් විසින් සේවය හැරයන නිලධාරීන්ගේ විස්තර එවැනි සිද්ධියක් ඇතිවූ වහාම එම සේවකයන්ගේ වැටුප් සකසන අංශය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

II. මාසික වැටුප් සකස් කරන ගිණුම් අංශයන් විසින් මාසික වැටුප් සකස් කිරීමට පෙර සේවය හැර ගිය නිලධාරීන් සිටී ද යන්න කිසියම් ආකෘති පත්‍රයක් ආශ්‍රයන් සකස් කළ වාර්තාවක් සේවක පැමිණීම වාර්තා කරන අංශය වෙතින් ගෙන්වා ගැනීමෙන් අනතුරුව මාසික වැටුප් සැකසීම ආරම්භ කළයුතු අතර සේවය හැරගිය නිලධාරීන් නොමැති නම්, අනිවාර්යයෙන්ම හිස් වාර්තාවක් හෝ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ.

III.දැනට විගණන විමසුම් මගින් හෝ වෙනත් ~~මූලාශ්‍රයකින්~~ මූලාශ්‍රවලින් වාර්තා වී ඇති මෙවැනි ගෙවීම් ඇත්නම් ඒ සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකිරීමට වහාම පියවර ගත යුතුය.මෙහිදී වගකිවයුතු පාර්ශවය ලෙස වැටුප් ලබාගත් සේවකයන් සේම එම සේවකයන්ගෙන් අයකර ගත නොහැකිනම්, එලෙස වැරදි වැටුප් ගෙවීමට දායක වූ නිලධාරීන් ද ඇතුළත්වන ලෙස කටයුතු කළ යුතුය.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්
01.ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,දකුණු පළාත - කා.දැ.ගැ.ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"